ශිෂ්‍යත්ව විභාග පෙරහුරු ප්‍රශ්න පත්‍රය

මහව අධ්‍යාපන කොට්ඨාසය

පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය.

විභාග අංකය.....	**II - පත්‍රය**	පැ: 01 යි මි: 15 යි

විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

* ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
* තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 62ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස ඇත.)

  පිළිතුරට යටින් ඉරක් අඳින්න ඇති විට ඉරක් පමණක් අඳින්න.
* පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
* පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	

	අවසාන ලකුණු
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	V/ I/ S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/ I/ S
ඇගයීම් ලකුණු තරවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/ I/ S EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය	V/ I/ S/ CII

සැකසුම : ශෂි විජේන්ද්‍ර
ව/ම/ම අඹන්පොල ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය

❍ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලියන්න.

01. පහත දී ඇති ඡේදය අවබෝධයෙන් කියවා අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න .

අපේ හේන එල්ලේ ගඟ මැද පිහිටි දූපතක් වෙයි. එය ගැමියන් හැඳින්වූයේ "මඩොල් දූව" යන නමිනි. කොග්ගල ඔයෙහි තැනින් තැන පිහිටි දූපත් රාශියෙන් මෙය ගැමියන් අතර ප්‍රකට වූයේ නපුරු මූකළානක් ද සර්ප විමානයක් ද ලෙසෙනි. එගොඩත් මෙගොඩත් පිහිටි ගම් තිහ හතළිහක මිනිසුන් අතීතයේ පටන් නයින්,පොළඟුන් , මාපිලන් ආදි සර්පයන් අල්ලා ඔරුවලින් ගෙන ගොස් දමන්නේ මඩොල් දූවෙහි ය.

(i) මඩොල් දූව පිහිටියේ කොහේ ද?

.....

(ii) ගැමියන් අතර මඩොල් දූව ප්‍රකට වූයේ කෙසේ ද?

.....

(iii) සර්පයින් අල්ලා ගෙන මඩොල් දූවට ගෙන යන්නේ කෙසේ ද?.....

(iv) එගොඩත් මෙගොඩත් පිහිටා තිබුණේ මොනවාද?.....

(v) ඡේදයේ සඳහන් වන ඔය කුමක් ද ? .....

(vi) <u>ප්‍රසිද්ධ</u> යන අදහසට සමානාර්ථ පදයක් ඡේදයෙන් සොයා ලියන්න. .....

(ලෙ-6)

02. පහත දී ඇති පද අතරින් වර්තමානකාල ඒක වචන ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) දුටුවා ය (ii) කැඩුවේ ය (iii) අසයි

(ලෙ-1)

03. දී ඇති වැකිවල උක්ත ආඛ්‍යාතය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(i) දරුවා පෙර පාසල වෙත පැමිණියේ ය. ( )

(ii) ගොවියන් කුඹුරු වැඩ කරති. ( )

(iii) ඔවුහු සැලකිලිමත් ව විමසා බැලූහ. ( )

(iv) ගිරවා ඉදුණු අඹ ගෙඩියක් කෑවා ය. ( )

(v) රියදුරා අධික වේගයෙන් බසය පදවාගෙන ගියේ ය. ( )

(ලෙ-5)

04. දී ඇති වචන ගළපා අර්ථවත් වැකි ලියන්න.

❍ වූ / අලියා / ගත්තේ ය. / කෝප / කඩන්නට /පටන් / පැල

..... (ලෙ-1)

05. පහත සඳහන් වාක්‍යයට ගැළපෙන විරාම ලකුණු යොදන්න.

ඕක මං දැකලා තියෙන ඕනෑ ම පැන්සලක් වගෙයි නේ කියා මුනුපුරා කිවුවා (ලකු-1)

06.පහත එක් එක් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) (1) ලේකනය (2) මුඛ්‍ය (3) සෞඛ්‍ය

(ii) (1) කලය (2) කනාමුට්ටිය (3) කණිෂ්ක

(iii) (1) ගැටලුව (2) උච්ඡාරණය (3) කළමණාකරණය (ලකු-3)

07. "අකුරක් නෑර" යන ඉඟි වැකියේ අදහස ලියන්න.

..... (ලකු-1)

08. ගැළපෙන ස්ත්‍රී ලිංග පද ලියන්න.

(1) ගොවියා :..... (2) කවියා :..... (ලකු-2)

09. "ශිෂ්‍යයා පාසල් යයි." යන වැකිය බහු වචන වැකියක් ලෙස ලියන්න

.....

10. පහත සඳහන් වැකි ලිඛිත බසින් ලියන්න. (ලකු-1)

(i) ළමයි ක්‍රීඩා පිටියට ගියා.

..... (ලකු-1)

(ii) නංගී මල් කැඩුවා.

..... (ලකු-1)

11. "ගොකොරු වේල්ල" තුන් තේරවිල්ල තෝරා එහි පිළිතුර පමණක් ලියන්න.

..... (ලකු-1)

12. "මම විනීත රියදුරෙක් වෙමි." යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වැකි තුනක් ලියන්න. උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය. එක් වැකියක් අවම වචන පහකටවත් නොඅඩු විය යුතු ය.

1.....

.....

2.....

.....

3.....

..... (ලකු-6)

13. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

(i) Table- ..... (ii) pineapple - ..... (ලකු-2)

14. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරින් ම ලියන්න.





(ලකුණු 2)

15. පහත දී ඇති ඉංග්‍රීසි වැකියේ සිංහල අදහස ලියන්න.

(1) **Please excuse me** .....

(2) **Who is shouting ?** .....

(ලකුණු 2)

16. "කාහම් කරුප්පු නිරම්"යන දෙමළ වැකියේ සිංහල අදහස ලියන්න.

..... (ලකුණු 1)

17. පහත වැකිය දෙමළ අදහසින් කියන ආකාරය සිංහලයෙන් ලියන්න.

මට පොත දෙන්න :..... (ලකුණු 1)

18. " හැටදහස් විසි පහ " යන සංඛ්‍යාවේ සංඛ්‍යාංකය ලියන්න.

..... (ලකුණු 2)

19. බිල්පත සම්පූර්ණ කරන්න.

ආහාර ද්‍රව්‍ය	ප්‍රමාණය	1 kg මිල		වටිනාකම	
		රු.	සත	රු.	සත
සීනී	1kg 500g	120	00	.....	.....
මුං ඇට	500g	410	00	205	00
කරවල	500g	441	00	220	50
				.....	.....


20. කුඩයක අඹ ගෙඩි 36 ක් ඇත. (ලකුණු 2)

(i) එයින් $\frac{3}{4}$ ක් යනු අඹ ගෙඩි කොපමණ ප්‍රමාණයක් ද? .....

(ii) පැන්සල් 120 කින් දහයෙන් පංගු හතරක ඇති පැන්සල් ගණන කීයද? ..... (ලකුණු 2)

21. ඔරලෝසුවේ නිරූපිත වේලාව පස්වරු වේලාවක් යැයි සලකා ඉදිරියේ ඇති හිස්තැන මත සම්මත(පැය24) ඔරලෝසු වේලාවෙන් ලියන්න.






(ලකුණු 2)

22. 38 , 47 , 56 , 65 , ... මෙම සංඛ්‍යා රටාවේ පොදු අන්තරය සොයා ලියන්න. (ලෙ-2)

.....


23. පෝෂණ වැඩ සටහනක දී එක් දරුවකුට බිස්කට් 4 බැගින් බෙදා දෙන ලදී. ඒ අනුව බිස්කට් 424 ක් දරුවන් කී දෙනෙකු අතර බෙදා දිය හැකිද ? ..... (ලෙ-2)

24. 

(1) රූපයේ අඳුරු කළ කොටස $\frac{6}{10}$ වීමට අවශ්‍ය ඉතුරු කොටස අඳුරු කරන්න.
(2) රූපයේ අඳුරු නොකළ ඇති මුළු කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

..... (ලෙ-2)

25. මෙම පතොරම යොදාගෙන සැකසිය හැකි සන වස්තුවේ,



(i) දාර ගණන කීයද? .....

(ii) ශීර්ෂ ගණන කීයද? ..... (ලෙ-2)

26. මල් ගණන හතරෙන් ගුණ කර ලැබෙන පිළිතුර රෝම සංඛ්‍යාවෙන් ලියන්න.




..... (ලෙ-2)

27. 6 l ක බීම බෝතලයකින් 300ml බැගින් වීදුරු තුනක් වත් කළ විට ඉතුරු බීම ප්‍රමාණය කොපමණද ? ..... ml (ලෙ-2)

28. අපේ නිවසට උතුරු දිශාවෙන් පන්සල පිහිටා ඇත. පන්සලට බස්නාහිර දිශාවෙන් රෝහල පිහිටා ඇත. රෝහල පිහිටා ඇත්තේ නිවසට කුමන දිශාවෙන් ද? ..... (ලෙ-2)

29. මාර්ගයක් සැකසීමේ දී පළමු අදියර 24km 300m දෙවන අදියර 18km 850m ක් ද සකසන ලදී. සකසන ලද සම්පූර්ණ දිග ප්‍රමාණය කොපමණද? ..... (ලෙ-2)

30. දින පහක දී අලෙවි සැලක අලෙවි කළ පාපැදි පිළිබඳ තොරතුරු ප්‍රස්තාරයේ නිරූපනය වේ.




(i) සඳුදා අලෙවි කළ ගණනේ දෙගුණයට දෙකක් වැඩියෙන් පාපැදි අලෙවි කළ දවස කවදාද?.....

(ii) එක සමාන පැපැදි ගණනක් අලෙවි කළ දවස් මොනවාද?

..... (ලෙ-2)

31. රූප ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.




(ලු-2)

වැඩිම සමමිතික අක්ෂ සංඛ්‍යාවක් නිරූපණය කළ හැකි හැඩතලය කුමක්ද? .....

32. දුම්රියකට පළමු නැවතුමේ දී මගීන් 485 ක් ඇතුළු වූ අතර මගීන් 68 ක් ඉන් බැස ගියහ. දෙවන නැවතුමේ දී මගීන් 178 ක් ඇතුළු වූ අතර මගීන් 97 ක් බැස ගියහ. ඉන් පසු කිසිදු වෙනසක් සිදු නොවුණි. ඉන් පසු දුම්රියේ සිටින මගීන් ගණන කීයද? ..... (ලු-2)

❍ප්‍රශ්න අංක 33-61 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

33. විද්‍යුත් චුම්භකයක් රූපයේ දැක්වේ.**A** වලින් නිරූපනය වන්නේ කුමක්ද?

A 

(1) වයරය (2) තඹ කම්බිය (3) අධාරකය

34. වසරේ නියමිත කාලයක දී පමණක් මල් හට ගන්නා ශාක කාණ්ඩය කුමක්ද?


(1) පොල් - මී (2) කජු -තේක්ක (3) සියඹලා - පුවක්

35. පහත සිදුවීම් අතරින් ස්වාභාවික සංසිද්ධියක් නොවන්නේ කුමක් ද?

(1) අකුණු ගැසීම (2) ගං වතුර (3) විදුලි සැර වැදීම

36. වියළී වැටෙන ශාක පත්‍ර පසට පොහොරක් ලෙස වන නිසා ඉංග්‍රීසීන් විසින් විනාශ කළ ශාකය කුමක්ද ?

(1) කොහොඹ ගස (2) මී ගස (3) සමනලයා

37. 

නිමල් වියළි කෝෂයක් ගෙන පහත ආකාරයේ බල්බයක් දැල්වීමට උත්සහ කළ ද එය නොදැල්විණි. එහි සිදු කළ යුතු වෙනස්කම කුමක්ද ?

(1) බල්බය මාරු කිරීම.

(2) වයර දෙක එකිනෙක මාරු කිරීම.

(3) කඩදාසිය වෙනුවට යකඩ ඇණයක් තැබීම.

38. පහත ශාක අතරින් අත්කම් සඳහා භාවිත නොකරන ශාකය කුමක්ද ?

(1) පොල් (2) තුන්හිරියා (3) කෙසෙල්

39. මනුක සමනලයෙක් බිහි කර ගැනීමට සමනල බිත්තර සහිත කතුරු මුරුංගා අත්තක් වීදුරු බෝතලයක දමා දින කීපයත් තැබුවේ ය. දළඹුවෙකු බිහි වී ටික දිනකින් දළඹු අවස්ථාව දක්නට නොලැබිණි ඉන් පසු අවස්ථාව කුමක් වන්නට ඇති ද ?

(1) බිත්තර (2) කෝෂය (3) සුහුඹුල් සමනලයා

40. පහත උපකරන අතරින් කම්මල් කර්මාන්තයේ දී සහ පෙදරේරු කර්මාන්තයේ දී භාවිතයට ගන්නා උපකරණය පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) සකපෝරුව,මයිනහම (2) කිණිහිර,මනිස්ලෑල්ල (3) මයිනහම,වරක්කලය

41. 

රූපයේ දැක්වෙන ශ්‍රේෂ්ඨ පුද්ගලයා සම්බන්ධ වැකිය කුමක් ද?

(1) පළමු ජාතික නිදහස් උළෙලට සහභාගී වීම.

(2) ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි නමින් රජකමට පත් වීම.

(3) දළදා මාලිගාවේ දිය වඩන නිළමේ තනතුර මෙහෙය වීම.

42. රෝපණය කිරීමට සුදුසු බීජයක ලක්ෂණය කුමක්ද ?

(1) පිට පොත්ත පැල්ලම් සහිත වීම

(2) හොඳින් මෝරා තිබීම (3) කෘමි හානි සහිත වීම

43. ආහාර ඇසුරුමක නිෂ්පාදිත දිනය 2025.02.15 ලෙස ද කල් ඉකුත් වීමේ දිනය 2025.03.15 ලෙස ද දක් වා තිබුණි. එම ආහාරය කුමක්ද?

(1) යෝගට් (2) අයිස්ක්‍රීම් (3) ටින් මාළු

44. පහත ආහාර කාණ්ඩ අතරින් යකඩ පෝෂකය වැඩියෙන් ඇති ආහාර කාණ්ඩය මොනවාද?

(1) අඹ - ගස්ලබු (2) නිවිතිය-සාරන (3) කරවල-බිත්තර

45. දුම්ගැසීම,වියළීම,පැකට් කිරීම,බෝතල් කිරීම යන ආහාර කල් තබා ගැනීමේ ක්‍රම සඳහා පිළිවෙළින් ආහාර කාණ්ඩ සඳහන් කර ඇති පිළිතුර කුමක්ද?

(1) බත්,මස්,අයිස්,බීම (2) මාළු,කොස්,බිම්මල්,කෝඩියල් (3) ජෑම්,පාන්,අඹ,කජු

46. ලංකා සිතියමේ කළු පැහැති කොටස අයත් පළාත කුමක්ද ?



(1) බස්නාහිර පළාත (2) දකුණු පළාත (3) වයඹ පළාත

47. පිටි සහ සීනි අධික ආහාර ගැනීමෙන් ඇති විය හැකි රෝගී තත්වය කුමක්ද ?

(1) දියවැඩියාව (2) අම්ලපිත්ත රෝගය (3) පිළිකාව

48. 

මෙම ක්‍රියාකාරකමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද?

(1) ජලය ඝන බවට පත්වන බව පෙන්වීම

(2) ජලය ද්‍රව බවට පත්වන බව පෙන්වීම

(3) ජලය වාෂ්ප බවට පත්වන බව පෙන්වීම

49. ශ්‍රී ලංකාවේ භූගත ජලය ලබා ගත නොහැකි නිසා වැසි ජලය භාවිත කරමින් තම අවශ්‍යතා සපුරා ගන්නේ කුමන ප්‍රදේශයේ ද?

(1) යාපනය (2) අනුරාධපුරය (3) ඩෙල්ෆ් දූපත්

50. 

මෙම ආගමික ස්ථානය සම්බන්ධ උත්සවය කුමක් ද?

(1) හජ්ජි උත්සවය (2) මහ සිකුරාදා (3) නව රාත්‍රී දේව පූජාව

51. මාර්ගයේ පදිකයින් ගමන් කළ යුත්තේ කුමන පැත්තෙන් ද?

(1) දකුණු පසින් (2) වම් පසින් (3) කහ ඉර මතින්


52. බීජයක් රෝපණය කළ විට මුලින් ම බීජයෙන් පිටතට පැමිණෙන්නේ කුමක්ද?

(1) මුල් (2) කඳ (3) පත්‍ර

53. දකුණු පළාතේ පිහිටි ඓතිහාසික ස්ථානය කුමක්ද ?

(1) සීගිරිය බලකොටුව (2) ගාලු බලකොටුව (3) යාපනය බලකොටුව

54. මෙම උපකරණයෙන් ගසක් දෙස බැලූ විට දැකිය හැකි ආකාරය කුමක්ද?





(1)



(2)




(3)

55. සර්ව භක්ෂක සතෙක් නොවන්නේ,

(1) ලේනා (2) නරියා (3) කටුස්සා

56. විද්‍යුත් චුම්භකයක් යොදාගෙන සැකසිය හැකි උපකරණය කුමක්ද?

(1) ඔරලෝසුව (2) විදුලි සීනුව (3) විදුලි පන්දම

57. 

රූපයේ දැක්වෙන සටහන සම්බන්ධ ක්‍රීඩාව කුමක්ද?

(1) බට්ටා පැනීම (2) පංච දැමීම (3) තාච්චි පැනීම

58. සහනශීලි චර්යා මගින් ඇතිවන ප්‍රධානතම වාසිය කුමක්ද?

(1) තමන්ට වර ප්‍රසාද ලැබීම (2) ගැටුම් වැළකී යාම (3) දෝෂාරෝපණ හිමිවීම

59. ශ්‍රී ලංකා සංචාරක සිතියමක ජලාශ නිරූපණය කරන වර්ණය කුමක්ද ?

(1) දම් (2) නිල් (3) රතු

60. 1796 වර්ෂයේ දී අපේ රටට පැමිණි ඉංග්‍රීසීන් අපේ රට මුළුමනින් ම, කන්ද උඩරට ගිවිසුම මගින් යටත් කරගත් වර්ෂය කුමක්ද?

(1) 1948 (2) 1818 (3) 1815

61. වාහන ආදායම් බල පත්‍රය කල් ඉකුත් වී ඇති බව නිමල් ගේ පියා දුටුවේ ය. ඔහු එසැණින් අනෙකුත් ලියවිලි ද රැගෙන ආදායම් බල පත්‍රය අලුත් කර ගැනීමට යම් ආයතනයක් වෙත ගියේ ය. එම ආයතනය කුමක්ද?

(1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (2) බැංකුව (3) පොලිසිය

62. " අශ්වයාගේ ගමන් විලාසය මුල් කරගත් වන්නම කුමක් ද?

(1) හනුමා වන්නම (2) තුරඟා වන්නම (3) මයුරා වන්නම

(සමස්ත ප්‍රශ්න පත්‍රයේ ම පැහැදිලි බව හා නිරවුල් බවට ලකුණු 2 ක් පිරිනමන්න.)